# කුරුවිට බටදොඹලෙන ගොළුබෙලි අර්ධ පොසිල හා වර්තමාන පරිසරයේ ගොළුබෙලි කවච සැසඳීම

කේ.ජී.ඩී. සුපුන් මධුවන්ත[1], එස්.එම්.කේ. අබේවර්ධන[2]

මුහුදු මට්ටමින් මීටර් 380-410 අතර උසකින් පිහිටන කුරුවිට බටදොඹ ලෙන ආශ්‍රිත හුදෙකලා වන රොද (forest patch) නිවර්තන වැසි වනාන්තර ලක්ෂණවලින් යුක්ත වන අතර එය අධික ජෛව විවිධත්වයක් උසුලන නොඉඳුල් වැසි වනාන්තරවලට ද හිමිකම් කියයි. එසේම දකුණු ආසියාතික පුරාවිද්‍යා ස්ථාන අතරින් මෙම ලෙන මුල් තැනෙහි ලා සලකණු ලැබේ. ක්‍රි.ව 1928 දී පී.ඊ.පී දැරණියගල විසින් බටදොඹලෙන මුල් වරට පුරාවිද්‍යා කැණීම් සඳහා සොයා ගන්නා ලද අතර අදින් වසර 48000 කට පෙර දකුණු ආසියාවේ නවීනතම මානවයාගේ වාසස්ථාන ලෙස පැවැති බව පසුව කළ පර්යේෂණවලදී තහවුරු විය. මෙම කැණීමේ දි හමු වූ ප්‍රධාන ගොළුබෙලි විශේෂ හය සැලකීමේ දී වර්තමානයේ ද එම පරිසර පද්ධතිය තුළ ඔවුන් දැකිය හැකි වන අතර එම ගොළුබෙලි කවචවල රූප හා ව්‍යුහ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදුකර සැසඳීම තුළින් ඒවා අද දක්වා නොනැසී පැවතුන බව ගම්‍යය වේ. එමෙන්ම මෙම අර්ධ පොසිල අධ්‍යයනය හා පාරිසරික දත්තයන් (උදා - පසේ PH අගය, ආර්ද්‍රතාවය) උපයෝගි කරගෙන මෙම පරිසර පද්ධතිය ප්‍රබල කාලගුණික හා පාරිසරික විපර්යාසයකට ලක්ව නොමැති බවට උපකල්පනය කළහැකිය. මෙහිදි භාවිත කළ මූලික පර්යේෂණ ක්‍රමවේදය වුයේ ක්ෂේත්‍ර අධ්‍යයනය හා සහභාගිත්ව නිරීක්ෂණය. ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය තොරතුරු අධ්‍යයනය කිරීම හා ඡායාරූප ආශ්‍රයෙන් ගොළුබෙලි කවචවල රූප හා ව්‍යුහ විද්‍යාත්මක සන්සන්දනය සිදු කෙරිණි. ඉහත ලබාගන්නා ලද දත්ත ගුණාත්මක විශ්ලේෂණයට ලක්කිරීමෙන් අනතුරුව මෙහි හමුවූ ගොළුබෙලි විශේෂ හය එදා මෙදා තුර විශාල පාරිසරික ව්‍යපර්යාසයකට ලක්වී නොමැති බව නිගමනය විය. මෙහි, දශක කිහිපයකට පෙර සිටම පුරාවිද්‍යාත්මක පර්යේෂණ සිදුවී තිබුණ ද, පාරිසරික මෙන්ම සාමාජීය හා අධ්‍යාපනික අගයෙන් හෙබි පර්යේෂණ සිදු කිරීම වත්මනෙහි ඉතාම අවම මට්ටමක පවති. මේ හේතුවෙන් බටදොඹලෙන වනරොදෙහි වත්මන් පාරිසරක දත්ත ඒකරාශි කර තැබීම තුළින් මේ පිළිබඳ පර්යේෂණ සිදු කරන පරිසරලෝලීන්ට හා පර්යේෂකයින්ට මහගු පිටුබලයක් ලැබෙනු ඇත. මන්ද යත් වත්මන් තත්ත්වය පිළිබඳ සත්‍ය වාර්තා නොමැති වුවහොත් පරිසර විපර්යාස සන්සන්දනයට පෙර තත්ත්වයන් සොයාගත නොහැකි වනු ඇත. එමෙන්ම ගල් ගුහා සංචරණය තුළින් මුතුන්මිත්තන් සොයා යෑම යන නව ප්‍රවණතාවයට යොමුවීමේදී නිසි ක්‍රමවේදයකට යොමුවීම තුළින් තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගත හැකිය.

ප්‍රමුඛ පද : නොයිඳුල් වැසි වනාන්තර, අර්ධ පොසිල, බලංගොඩ මිනිසා, ගොළුබෙලි කවච, ගල් ගුහා සංචරණය

[1] සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශය, සන්ඩර්ලන්ඩ් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය. *Supunmadhu2212@gmail.com*